**2023.02.06 වන දින පෙ.ව. 09.30 ට හපුතලේ ප්‍රාදේශීය සභාවේ**
**නව සභා රැස්වීම් ශාලාවේදී පැවති**
**හපුතලේ ප්‍රාදේශීය සභා මාසික මහා සභා රැස්වීම් වාර්තාව**

**පැමිණීම**

| | | | |
|---|---|---|---|
| 1. | බී. කන්දසාමි මයා | - | ගරු සභාපති |
| 2. | වයි.එම්.නිමල් අමරසිරි මයා | - | ගරු උපසභාපති |
| 3. | එස්. සගාදේවන් මයා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 4. | ආර්.එම්. ඉන්ද්‍රතිලක රාමනායක මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 5. | කේ.එම්. විමලසිරි මයා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 6. | කේ.ඒ. චන්දන කිත්සිරි පෙරේරා මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 7. | ගෝපාලන් මුරුගන් මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 8. | එල්.එච්. ඉන්දික සම්පත් මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 9. | ඩී.සුදත් අරුණ රංජන මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 10. | සවරිමුත්තු ප්‍රභාහර් මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 11. | එෆ්. වයලට් රෝස් මහත්මිය | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීණී |
| 12. | මාරප්පන් කන්දසාමි මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 13. | තංගවේලු මහේන්ද්‍රන් මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 14. | වේලුසාමි එලිල් අරසි මිය | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීණී |
| 15. | එම්.ඒ. නිල්මිණී චන්ද්‍රකාන්ති මිය | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීණී |
| 16. | එච්.ඒ.ඩී. චාන්දනී මානෙල් කුමාරි මිය | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීණී |
| 17. | ආර්.එල්.සුදර්ශන මහතා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |

**01.පසුගිය රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම**

හපුතලේ ප්‍රාදේශීය සභාවේ 2023.01.09 වන දින පවත්වන ලද මාසික මහ සභාවෙ හි මහ සභා වාර්තාව කියවූවා සේ සළකා සභා සම්මත කිරීම සිදු කරන ලෙස ගරු මූලාසනය විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා උප සභාපති වයි.එම්. නිමල් අමරසිරි මහතා විසින් පසුගිය මහ සභා වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට යෝජනා කරන ලද අතර, එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. සුදත් අරුණ රංජන මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව පසුගිය මහ සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**02. සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

නාගරික සංවර්ධන අධිකාරිය මගින් ලද අංක 25/01/02/12/19 දරණ 2023-01-31 දිනැති බණ්ඩාරවෙල නගර සංවර්ධන සැලැස්ම 2023-2033 සම්බන්ධ ලිපිය

**03. සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන**

නැත

**04. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න.**

නැත

**05.** **යථා පරිදි කල් දී ඇති යෝජනා**

**යෝජනා අංක 01**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

හපුතලේ ප්‍රාදේශීය සභාව සතු අංක PB- 8665 දරණ කැබ් රථය වෙන්දේසි කිරීම සඳහා මිල ගණන් කැඳවන ලද අතර 2023.02.01 වන දින ප්‍රසම්පාදන කමිටුව විසින් එකී මිල ගණන් විවෘත කිරීමේ කටයුතු සිදු කරන ලදී.ඒ අනුව මිල ගණන් 09 ක් පහත පරිදි ඉදිරිපත් කර තිබූ අතර එකී මිල ගණන් විවෘත කිරීමේ කමිටු වාර්තාව අනුව ටෙන්ඩරය පිරිනැමීම පිළිබඳව ප්‍රසම්පාදන තීරණය ලබා ගැනීම සුදුසු බව යෝජනා කරන්නී ය.

**ලංසු ලේඛනය**

| අනු අංකය | ප්‍රසම්පාදන ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය | මුදල | | |
|---|---|---|---|---|
| | | ඉලක්කමෙන් | අකුරින් | |
| 01 | කොටගෙදර ලියනගේ ශිරාන් පෙරේරා ඇවරියවත්ත වැලිවේරිය | 1,236,550.00 | දොලොස්ලක්ෂ තිස්හයදහස් පන්සිය පනහයි | |
| 02 | කලගේ ආරච්චිගේ දොන් ශාමන් ලෙස්ටර් පෙරේරා සී/1 මද්දුමාවත්ත නුගේගොඩ | 1,055,555.00 | දසලක්ෂ පනස්පන්දහස් පන්සිය පනස් පහයි | |
| 03 | රත්නායක මුදියන්සේලාගේ ජයන්ත චන්ද්‍රදේව රත්නයාක 100ඒ දුම්රිය පටුමග දියතලාව | 1,455,000.00 | දහහතර ලක්ෂ පනස්පන්දහසකි | |
| 04 | මානවඩුගේ විමල්තිස්ස අංක 26 කෙලින්වීදිය දියතලාව | 966,000.00 | නවලක්ෂ හැට හයදහසයි | |
| 05 | හේරත් මුදියන්සේලාගේ සුරංග ලක්මාල් හේරත් සදැල්ල ඒඩරුගොල්ල බොරලන්ද | 1,413,678.99 | දහහතරලක්ෂ දහතුන්දහස් හයසීය හැත්තෑ අටයි ශත අනූනවයයි | |
| 06 | වීරසේකර මුදියන්සේලාගේ සරත් රංජිත් වීරසේකර චාන්දනි යහලබැද්ද හපුතලේ | 2,500,610.00 | විසිපන්ලක්ෂ හයසීය දහයයි | |
| 07 | ඩබ්.ජේ.එම්. සම්පත් ඉන්දික සම්පත් ඇල්ලගම දියතලාව | 210,590.00 | විසිඑක්ලක්ෂ පන්සිය අනූවයි | |
| 08 | ලංකාධිකාර රාජපක්ෂ මුදියන්සේලාගේ ලක්මින බණ්ඩාරනායක ග්‍රීන් හෙවන් ජයමිනිපුර දියතලාව | 1,456,000.00 | දාහතරලක්ෂ පනස් හය දහසකි | |
| 09 | මොරවක අනිල් පෙරේරා ඊ 18 විහාරකැලේ පාර දියතලාව | 1,856,156.00 | දහඅටලක්ෂ පනස් හයදහස් ඒකසීය පනස් හයයි | |

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා උප සභාපති වයි.ඒම්. නිමල් අමරසිරි මහතා

විවාද

හපුතලේ ප්‍රාදේශීය සභාව සතු අංක PB- 8665 දරණ කැබ් රථය වෙන්දේසි කිරීම සඳහා මිල ගණන් කැඳවන ලද අතර 2023.02.01 වන දින ප්‍රසම්පාදන කමිටුව විසින් එකී මිල ගණන් විවෘත කිරීමේ කටයුතු සිදු කරන ලදී.ඒ අනුව මිල ගණන් 09 ක් පහත පරිදි ඉදිරිපත් කර තිබූ අතර එකී මිල ගණන් විවෘත කිරීමේ කමිටු වාර්තාව අනුව ටෙන්ඩරය පිරිනැමීම පිළිබඳව ප්‍රසම්පාදන තීරණය ලබා ගැනීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

**ලංසු ලේඛනය**

| අනු අංකය | ප්‍රසම්පාදන ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය | මුදල | | |
|---|---|---|---|---|
| | | ඉලක්කමෙන් | අකුරින් | |
| 01 | කොටගෙදර ලියනගේ ශිරාන් පෙරේරා ඇවරියවත්ත වැලිවේරිය | 1,236,550.00 | දොලොස්ලක්ෂ තිස්හයදහස් පන්සිය පනහයි | |

| | | | | |
|---|---|---|---|---|
| 02 | කලගේ ආරච්චිගේ දොන් ශාමන් ලෙස්ටර් පෙරේරා සි/1 මද්දුමාවත්ත නුගේගොඩ | 1,055,555.00 | දසලක්ෂ පනස්පන්දහස් පන්සිය පනස් පහයි | |
| 03 | රත්නායක මුදියන්සේලාගේ ජයන්ත චන්ද්‍රදේව රත්නයාක 100ඒ දුම්රිය පටුමග දියතලාව | 1,455,000.00 | දහහතර ලක්ෂ පනස්පන්දහසකි | |
| 04 | මානවඩුගේ විමල්තිස්ස අංක 26 කෙලින්වීදිය දියතලාව | 966,000.00 | නවලක්ෂ හැට හයදහසයි | |
| 05 | හේරත් මුදියන්සේලාගේ සුරංග ලක්මාල් හේරත් සදැල්ල ඒඩරුගොල්ල බොරලන්ද | 1,413,678.99 | දහහතරලක්ෂ දහතුන්දහස් හයසීය හැත්තෑ අටයි ශත අනූනවයයි | |
| 06 | වීරසේකර මුදියන්සේලාගේ සරත් රංජිත් වීරසේකර වාන්දනි යහලබැද්ද හපුතලේ | 2,500,610.00 | විසිපන්ලක්ෂ හයසීය දහයයි | |
| 07 | ඩබ්.ඒම්. සම්පත් ඉන්දික සම්පත් ඇල්ලගම දියතලාව | 210,590.00 | විසිඑක්ලක්ෂ පන්සිය අනුවයි | |
| 08 | ලංකාධිකාර රාජපක්ෂ මුදියන්සේලාගේ ලක්මිත බණ්ඩාරනායක ග්‍රීන් හෙවන් ජයමිනිපුර දියතලාව | 1,456,000.00 | දාහතරලක්ෂ පනස් හය දහසකි | |
| 09 | මොරවක අනිල් පෙරේරා ඊ 18 විහාරකැලේ පාර දියතලාව | 1,856,156.00 | දහඅටලක්ෂ පනස් හයදහස් ඒකසීය පනස් හයයි | |

ඉහත සඳහන් පරිදි ලංසුකරුවන් 09 දෙනෙකු විසින් මිල ගණන් ඉදිරිපත් කර ඇති අතර ඉන් පහත සඳහන් ලංසුකරුවන් වන

- කොටගෙදර ලියනගේ ශිරාන් පෙරේරා ඇවරියවත්ත වැලිවේරිය
- කලගේ ආරච්චිගේ දොන් ශාමන් ලෙස්ටර් පෙරේරා සි 1/මද්දුමාවත්ත නුගේගොඩ
- මානවඩුගේ විමල්තිස්ස අංක 26 කෙලින්වීදිය දියතලාව

තක්සේරු මුදල වන රුපියල් ලක්ෂ දහහතරකට වඩා අඩු මිල ගණන් ඉදිරිපත් කර ඇති බැවින් ඔවුන්ගේ මිල ගණන් පිළි නොගන්නා බව දැන්වීමත් එසේම වැඩිම මිල ගණන් ඉදිරිපත් කර ඇති **වීරසේකර මුදියන්සේලාගේ සරත් රංජිත් වීරසේකර වාන්දනි යහලබැද්ද හපුතලේ** යන අයට මෙම ලංසුව පිරිනැමීම සුදුසු බවත් මහ සභාව තීරණය කරන ලද අතර මෙම අවස්ථාවේ දී මූලාසනය ( ගරු සභාපතිතුමා ) විසින් මෙම ලංසුකරු අදාළ ලංසුව ඉදිරිපත් කිරීම මෙම කැබ් රථයේ වෙළඳපොළ වටිනාකම පිළිබඳව මනා අවබෝධයකින් තොරව සිදු කළ බැවින් එය ඉල්ලා අස්කර ගන්නා බව තමාට පැවසූ බව ප්‍රකාශ කරන ලදී.එහිදී ගරු උප සභාපති වයි.එම්. නිමල් අමරසිරි මහතා විමසා සිටියේ එසේ ප්‍රතික්ෂේප කිරීම ඉදිරිපත් කර ඇති ඊළඟ ලංසුකරුවන් විසින් ද සිදු කළ හොත් කුමක් සිදු කරන්නේ ද යන්නයි.ඒ අනුව මෙහිදී ගරු සභාපතිතුමන් විසින් පැහැදිලි කරන ලද්දේ මෙසේ මිල ගණන් ඉවත් කර ගැනීම දිගින් දිගටම සිදු වන්නේ නම් මෙම සියලු මිල ගණන් අවලංගු කර නැවත ටෙන්ඩර් කිරීමේ ක්‍රමවේදය අනුගමනය කිරීම සිදු කළ යුතු වීම ප්‍රසම්පාදන ක්‍රමවේදය වුවද මෙය නැවත ටෙන්ඩර් කිරීමේ දී මේ තක්සේරු මුදල ප්‍රසිද්ධ වීම සිදු වී ඇති හෙයින් පළමුව ඉදිරිපත් කර ඇති ලංසුකරු වෙත ලංසු පිරිනැමීමේ ලිපි යොමු කිරීම සුදුසු බවත් ඊට පසුව එසේ ප්‍රතික්ෂේප කිරීම් සිදුවන්නේ නම් වෙළඳපොළ වටිනාකමට වඩා ඉහල මිල ගණන් ඉදිරිපත් කර ඇති ඉල්ලුම්කරුවන් වෙත ලංසුව පිරිනැමීමට කටයුතු කිරීම සුදුසු බව තීරණය කිරීම මහ සභාව විසින් සිදු කිරීම සුදුසු බවයි.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 02**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

හපුතලේ ප්‍රාදේශීය සභාව පැරණි ගොඩනැගිල්ල පැවති ස්ථානයේ ඉදි කරන ලද ගොඩනැගිල්ලෙහි තක්සේරු වාර්තාව අනුව එකී ගොඩනැගිල්ල වසර 10 ක කාලයක් සඳහා බදු දීමට ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය හා මූල්‍ය රීති අනුව ජාතික තරගකාරී ලංසු කැඳවීම සිදු කළ වුවද මේ සඳහා පුවත්පත් දැන්වීම සඳහා වැය වන වියදම අධික වීම මත හා ප්‍රාදේශීය

වශයෙන් මිල ගණන් ඉදිරිපත් කරන්නන් වෙත අවස්ථාව සලසා දීම සඳහා ප්‍රමුඛතාවය ලබා දීම අරමුණු කර ගෙන ප්‍රාදේශීය වශයෙන් මිල ගණන් ලබා ගැනීම සුදුසු බව යෝජනා කරන්නී ය.

<u>ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. සුදත් අරුණ රංජන මහතා</u>

<u>විවාද</u>

හපුතලේ ප්‍රාදේශීය සභාව පැරණි ගොඩනැගිල්ල පැවති ස්ථානයේ ඉදි කරන ලද ගොඩනැගිල්ලෙහි තක්සේරු වාර්තාව අනුව එකී ගොඩනැගිල්ල වසර 10 ක කාලයක් සඳහා බදු දීමට ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය හා මූල්‍ය රීති අනුව ජාතික තරගකාරී ලංසු කැඳවීම සිදු කළ වුවද මේ සඳහා පුවත්පත් දැන්වීම සඳහා වැය වන වියදම අධික වීම මත හා ප්‍රදේශීය වශයෙන් මිල ගණන් ඉදිරිපත් කරන්නන් වෙත අවස්ථාව සලසා දීම සඳහා ප්‍රමුඛතාවය ලබා දීම අරමුණු කර ගෙන ප්‍රාදේශීය වශයෙන් මිල ගණන් ලබා ගැනීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. සුදත් අරුණ රංජන මහතා මෙකී ගොඩනැගිල්ල කොපමණ කාලයක් සඳහා බදු පදනම මත ලබා දෙන්නේද යන්නත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්. එම්. රාමනායක මහතා මෙකී ගොඩනැගිල්ලේ තක්සේරු වටිනාකම කොපමණ ද යන්නත් විමසන ලද අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී. මහේන්ද්‍රන් මහතා ප්‍රදේශීය වශයෙන් මිල ගණන් ඉදිරිපත් කරන්නන් වෙත අවස්ථාව සලසා දීම අරමුණු කර ගෙන බල ප්‍රදේශයේ ජනතාවට ප්‍රමුඛතාවය ලබා දීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 03**

<u>ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා</u>

හපුතලේ ප්‍රාදේශීය සභාවේ 2022-12-31න් අවසන් වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීම සුදුසු බව යෝජනා කරන්නී ය.

<u>ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්. රාමනායක මහතා</u>

<u>විවාද</u>

හපුතලේ ප්‍රාදේශීය සභාවේ 2022-12-31න් අවසන් වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී. මහේන්ද්‍රන් මහතා අදහස් දක්වමින් මෙවර පවත්වන ලද භාණ්ඩ සමීක්ෂණ කටයුතු සඳහා සභික මණ්ඩල නියෝජනය සිදු වූයේ ද යන්න විමසන ලද අතර 2022-12-31 න් අවසන් වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ කටයුතු සඳහා සභික මණ්ඩල නියෝජනය වූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එච්.ඒ.ඩී. චාන්දනී මානෙල් කුමාරි මහත්මිය හට සහභාගි වීමට නොහැකි වූ බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 04**

<u>ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා</u>

2023 වර්ෂයේ මාර්තු මස මහ සභාව පැවැත්වෙන දිනය තීරණය කිරීම සුදුසු බව යෝජන කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා උප සභාපති වයි.ඒම්. නිමල් අමරසිරි මහතා

විවාද

2023 වර්ෂයේ මාර්තු මස මහ සභාව පැවැත්වෙන දිනය ලෙස 2023 මාර්තු මස 07 වන දිනය තීරණය කිරීම සුදුසු බව යෝජන කරන්නී ය.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**06. කාරක සභා වර්තාව**

2022.02.01 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තා සභාව වෙත ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා ගරු සභාවේ එකඟතාවය ලැබිණි.

**07. ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ**

2023 ජනවාරි මස ලැබීම් හා වියදම් පිළිබඳ මාසික වාර්තාව සභාව වෙත ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා ගරු සභාවේ එකඟතාවය ලැබිණි.

**08.වෙනත් කරුණු**

**08.1 ගරු මන්ත්‍රීවරුන්ගේ නිවාඩු**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම්. සීගිරි ලංකා ඒකනායක මහතා අසනීප නිවාඩු ලබා ඇති බව ගරු මූලාසනය විසින් දැනුම් දුන් අතර ඒ සඳහා ගරු සභාවේ එකඟතාවය ලැබුණි.

**08.2 ගරු මන්ත්‍රීවරුන්ගේ අදහස් දැක්වීම.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී. මහේන්ද්‍රන් මහතා අදහස් දක්වමින් ග්ලැනනෝර් නව නිවාස සංකීර්ණයේ ඉදි කර ඇති ප්‍රජා ශාලාව ග්‍රාම සංවර්ධන සමිතියට පවරා දෙන ලෙසට ඉල්ලීමක් සිදු කරන බව ප්‍රකාශ කරන ලදී.

මෙදින සභා රැස්වීම ප.ව.12.00ට අවසන් විය.

සංශෝධන

2023.02.06 වන දින පැවති මහ සභා වාරයේ දී යථා පරිදි කල් දී ඇති යෝජනා අංක 01 හා 02 යන යෝජනා ස්ථිර කරනු ලබන අවස්ථාවලදී ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්. එල් . සුදර්ශන මහතා සභා ගර්භය තුළ නොසිටි බව සභා වාර්තාවේ සඳහන් වී නොමැති බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්. එල් . සුදර්ශන මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

බී.කන්දසාමි,
සභාපති,
හපුතලේ ප්‍රාදේශීය සභාව,
දියතලාව